ජාතික රක්ෂණ භාර අරමුදල - 2019
---

**1.1** තත්ත්වාගණනය කළ මතය
---

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදලේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදලේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

-------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2019 වර්ෂයේ SRCC අංශයට අදාළව රු.49,904,512,615 ක් වටිනා ජර්නල් සටහන් 86 ක් ගිණුම්ගත කර තිබුණි. එම වටිනාකමට අදාළව රු.600 සිට රු.11,741,632,260 ක් දක්වා වූ පරාසයක ජර්නල් සටහන් ගිණුම්ගත කිරීම, එක් නිලධාරියෙකුගේ (රක්ෂණ නිලධාරී හෝ කළමනාකරණ සහකාර) සකස් කිරීම මත පමණක් පදනම්ව ගිණුම්ගත කර තිබුණු අතර එම සටහන් නිර්දේශ කිරීමක්/ අනුමත කිරීමක් වැනි බලය ලබාදීමේ ක්‍රියාවලියක් හරහා සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | ජර්නල් සටහන් නිර්දේශ කිරීමේ සිට අනුමත කිරීම දක්වා ක්‍රියාවලියක් හඳුන්වා දී 135-136 අනුව බලය බෙදා දීමට පියවර ගෙන ඇත. | වර්ෂය ආරම්භයේ විධිමත් බලය බෙදාදීමක් සිදු කළ යුතුවීම |
| (ii) අරමුදලේ එකතුව රු.2,285,375,145 ක් වූ වටිනාකමට අදාළව රු.201,366 සිට රු.985,726,780 ක පරාසයක ජර්නල් සටහන් 10 ක් ගිණුම්ගත කර තිබුණු අතර එම සටහන් කිසිදු නිලධාරියෙකු විසින් අනුමත කිරීමක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | වර්ෂය ආරම්භයේ විධිමත් බලය බෙදාදීමක් සිදු කළ යුතුවීම |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01- මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම ප්‍රමිතියෙහි 32 වන ඡේදය ප්‍රකාරව, අස්ථිත්වයක් විසින් ප්‍රමිතියක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හෝ ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතු බව සඳහන් වුවද, ප්‍රතිරක්ෂණ අංශයෙහි පෞද්ගලික රක්ෂණ සමාගමකට අදාලව ලැබිය යුතු වාරික ආදායම තුළ දින 90 ඉක්ම වූ රු 9,479,46 .ක බැර ශේෂයක් ප්‍රතිරක්ෂණ අංශයේ ලැබිය යුතු ශේෂය තුළට ඇතුළත් කිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ලැබිය යුතු වාරික ආදායම රු 9,479,460 .කින් අඩුවෙන් දක්වා තිබුණි. එසේම, මෝටර් නොවන අංශයෙහි ලැබිය යුතු වාරික ආදායම් ගිණුමේ රු.412,293 ක් වූ බැර ශේෂයන් ඇතුළත්වීම හේතුවෙන් මෝටර් නොවන ලැබිය යුතු වාරික ආදායම ද රු.412,293 කින් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන තීරණ සමඟ එකඟ වන අතර නිවැරදි කර ගැනීමට පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවෙමින් පිළියෙල කළ යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් රක්ෂණාවරණයට (SRCC) අදාළව 2011 වර්ෂය සඳහා ඉන්වොයිස්පත් නිකුත් කිරීමේදී මෝටර් රථ නොවන වාරික ආදායමෙන් ගෙවිය යුතු කොමිස් අඩු කර මාසික ශුද්ධ ආදායම ඉන්වොයිස් කර තිබුණි.එසේ වුවද ,ගිණුම් ඉදිරිපත් කිරීමේදී දළ වාරික ආදායම හා කොමිස් සඳහා වූ වියදම් වෙන වෙනම ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ආදායම් ප්‍රකාශයේ වාරික ආදායම මත ගණනය කරන ජාතිය ගොඩනැගීමේ බදු බැරකම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු.35,967,319 ක අතිරේක තක්සේරුවක් කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර මෙම ගෙවිය යුතු | 2011 වර්ෂය සඳහා ඉන්වොයිස් පත් නිකුත් කිරීමේදී ඉන් පෙර පැවති පරිචය පරිදි මෝටර් රථ නොවන වාරික ආදායමෙන් ගෙවියයුතු කොමිස් අඩු කර මාසික ශුද්ධ ආදායම ඉන්වොයිස් කිරීම සිදු කරන ලදී. එහෙත් ගිණුම් ඉදිරිපත්කිරීමේදී දළ වාරික ආදායම හා කොමිස් සඳහා වූ වියදම් වෙනම ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ආදායම් ප්‍රකාශයේ වාරික ආදායම මත වැට් බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කළ විය අප ආයතනයෙන් ගෙවූ බදු ප්‍රමාණයෙහි අඩුවක් තිබිණ. ඒ සඳහා අතිරේක තක්සේරුවක් කරන ලදී. කෙසේ වුවද, SRCC වාරික ආදායම මත දේශීය සාමාන්‍ය රක්ෂණ ආයතනද පාරිභෝගිකයන්ගෙන් | බදු ගෙවීම විධිමත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ජාතිය ගොඩනැගීමේ බදු බැරකම වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ කිසිදු වෙන් කිරීමක් සිදු කර නොතිබුණි. | අයකරන වාරික මත, දේශීය ගොඩනැගීමේ බදු අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශණය කරයි. එබැවින් එය එකම ආදායම මත බදු ද්විගණනය වීමක් වන බැවින් එම ජාතිය ගොඩනැගීමේ අතිරේක බදුවලින් නිදහස් කරන ලෙස අභියාචනාවක් කළද තවදුරටත් ගෙවිය යුතු ශේෂයක් ලෙස දන්වා ඇති අතර ඒ සඳහා මූල්‍ය ප්‍රකාශ තුළ වෙන් කිරීමක් සිදු කර නොමැත. | |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාර්තුවට අදාළ භෝග රක්ෂණ බදු ආදායම වූ රු.430,506,164 ක මුදල්, 2020 ජනවාරි මාසය තුල ලැබී තිබුණත් එම මුදල 2019 වර්ෂයට ලැබිය යුතු ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර 2018 වර්ෂයේ අවසන් කාර්තුවට අදාළව 2019 වර්ෂයේදී ලැබී තිබූ රු.394,646,100 ක මුදල ප්‍රවර්තන වර්ෂයේ ලැබීමක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයට අදාළ වගා බදු ආදායම රු.35,860,064 ක් වැඩියෙන් දක්වා තිබුණි. එසේම රු.394,646,100 කින් ලැබිය යුතු භෝග රක්ෂණ බදු අඩුවෙන් දක්වා තිබුණි. | මෙම අරමුදල සඳහා මුදල් රැස් කිරීම ඒ හා සම්බන්ධ ආයතන වල ලාභය මත තීරණය වේ. එබැවින් අනෙකුත් ආයතන ලබන ලාභය සම්බන්ධයෙන් අප ආයතනයට පුරෝකථනයක් සිදු කළ නොහැකි බව දන්වා සිටින අතර ලැබිය යුතු වගා බද්ධ සම්බන්ධයෙන් ගිණුම් ගත කොට නැත. කෙසේ වෙතත් වර්ෂය සඳහා කාර්තු 4 ක ආදායම ඇතුලත් වී ඇත. | සමාලෝචිත වර්ෂයට අදාල නිවැරදි තොරතුරු මත ගිණුම් පිළියෙල කළ යුතු වීම. |
| (iii) | 2019 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු අග්‍රහාර රක්ෂණ වාරික ගිණුම් ගත නොකිරීම නිසා අග්‍රහාර රක්ෂණ ආදායම සහ අදාළ ලැබිය යුතු ගිණුම රු.355,310,770 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අග්‍රහාර වාරික ආදායම ගණනය කිරීමේදී අදාල මාසය සඳහා ලැබෙන අදායම මාසික අදායම ලෙස සැලකේ. එනම් මුදල් පදනම මත ගිණුම් ගත කර ඇත. එබැවින් 2018 වර්ෂයට අදාලව 2019 වර්ෂය තුල රු.245,693,637ක මුදලක් ගිණුම් ගත වී ඇත. | සමාලෝචිත වර්ෂයට අදාල නිවැරදි තොරතුරු මත ගිණුම් පිළියෙල කළ යුතු වීම |
| (iv) | ජාතික රක්ෂණ භාර අරමුදලේ හා SRCC & TR අංශයේ විදේශ මුදල් ගිණුම් 03 ක, 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කර නොතිබීම හේතුවෙන් රු.875,650 ක් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි. | අරමුදලේ USD හා Euro ශේෂයන් හා SRCC අංශයේ ශේෂයන් රුපියල් වලට පරිවර්තනය කිරීමේ දෝෂය නිවැරදි කිරීමට සටන්කර ගතිමි. | සමාලෝචිත වර්ෂයට අදාල නිවැරදි තොරතුරු මත ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ප්‍රතිරක්ෂණ ආයතන විසින් ලැබිය යුතු මුදල් | 1,068,471,618 | ඍජු ශේෂ සනාථන ලිපි | ශේෂ සනාථන ලිපි ආයතන වෙත යවා ඇතත් පිළිතුරු තවමක් ලැබී නැත. ලද විගස විගණනය සඳහා ඉදිරිපත් කරමු.<br><br>මෙම ශේෂය 2017 වර්ෂයේ සිට පැවත එන ගෙවිය යුතු ශේෂයකි.ඒ පිළිබඳව විගණන කමිටුවේ නිර්දේශ අනුව අධ්‍යක්ෂක මණ්ඩලයට යොමුකර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමු. | ඍජු ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කළයුතුවීම |
| (ii) | ලැබිය යුතු මුදල් - ප්‍රතිරක්ෂණ | 9,053,364 | විස්තරාත්මක උපලේඛන | පිළිතුරු ලබා දී නැත. | විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළයුතුවීම. |
| (iii) | නිරවුල් කළ යුතු හිමිකම් වන්දි | 4,077,033 | විස්තරාත්මක උපලේඛන | මෙම ශේෂය සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කර ලැබෙන උපදෙස් මත ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමු. | විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළයුතුවීම |
| (iv) | වැඩවර්ජන, කැරලි කෝලහල හා ත්‍රස්තවාදී අරමුදල් ඒකකය වෙත ගෙවිය යුතු මුදල් | 644,068 | විස්තරාත්මක උපලේඛන | පිළිතුරු ලබා දී නැත. | විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළයුතුවීම. |
| (v) | වෙනත් මූල්‍ය නොවන වත්කම් - ලැබිය යුතු වටිනාකම | 3,462,111 | විස්තරාත්මක උපලේඛන | මෙහි සඳහන් ශේෂයන් සම්බන්ධයෙන් පෙර පැවති අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර ඔවුන්ගේ මතය වූයේ විගණන මණ්ඩලයේ අනුමැතිය අනුව කටයුතු කරන ලෙසය. විගණන මණ්ඩලයේ අනුමැතිය වූයේ නැවතත් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කරන ලෙසය. එබැවින් මෙම ශේෂයන් සම්බන්ධ තීරණය නව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරියේදී යොමු කිරීමට කටයුතු කරමු. | |

**1.6** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **I)** ගිණුම් අංක **8605** දරන **Slip Returned Control – Agrahara** ගිණුමේ වර්ෂ පහක සිට පැවත එන රු.**6,235,690** ක ගෙවිය යුතු අග්‍රහාර හිමිකම් වටිනාකමක් වූ අතර මේ දක්වා මෙම මුදල, අදාළ පාර්ශව වෙත ගෙවීමට හෝ තවදුරටත් එබඳු වගකීමක් නොමැති නම් ඒ සඳහා පියවර ගෙන හෝ නිවැරදිව ගිණුම්ගත කිරීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | මෙහි සඳහන් ශේෂයන් සම්බන්ධයෙන් පෙර පැවති අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර එති අතර ඔවුන්ගේ මතය වූයේ විගණන මණ්ඩලයේ අනුමැතිය අනුව කටයුතු කරන ලෙසය. විගණන මණ්ඩලයේ අනුමැතිය වූයේ නැවතත් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කරන ලෙසය. එබැවින් මෙම ශේෂයන් සම්බන්ධ තීරණය නව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරියේදී යොමු කිරීමට කටයුතු කරමු. | අග්‍රහාර ප්‍රතිලාභ සාමාජිකයින් වෙත හැකි ඉක්මනින් ගෙවා අවසන් කළ යුතු වීම |
| **II) 2007** වර්ෂයේ සිට පැවත එන රු.**3,843,488** ක ආපසු ගෙවිය යුතු වාරික මුදල් ශේෂයක් වූ අතර එම ගෙවිය යුතු වාරික මුදල් නිරවුල් කිරීමට හෝ එම වටිනාකම් පියවීමට ඇති බැදියාව පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගෙන එම වටිනාකම් ගිණුම්ගත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. තවද, මෙතෙක් මෙම ශේෂය පිළිබඳ හානිකරණ **(Impairment)** ගැලපීමක් ද සිදුකර නොතිබුණි. | මෙම ශේෂය සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කර ලැබෙන උපදෙස් මත ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමු. | අග්‍රහාර ප්‍රතිලාභ සාමාජිකයින් වෙත හැකි ඉක්මනින් ගෙවා අවසන් කළ යුතු වීම |

**1.7** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි මුදල් රෙගුලාසි **396** | ගිණුම් අංක **8630** යටතේ ගෙවිය යුතු නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම රු.**51,365,408** ක් චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. **396** පරිදි කටයුතු කර නොතිබුණි. | බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් අතරින් බොහොමයක් ස්වාභාවික ආපදා රක්ෂණයට අදාල වේ. මේ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කර ඇතත් බොහොමයක් තවමත් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් කර නැත. ඉන් යම් චෙක්පත් ප්‍රමාණයක් චෙක්පත් ලාභීන් ඉදිරිපත් නොවීම මත දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් ආපසු හරවා | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම . |

| | | | |
|---|---|---|---|
| | | ඒවා ඇත. එම වටිනාකම රු.5,205,873 මෙම ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලදී. ඉතිරි චෙක්පත් සම්බන්දව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරමු. | |
| (ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි මුදල් රෙගුලාසි 396 | 2019 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව, නිකුත් කර මාස 06 ක් ගත වූ එනම් 2018 වර්ෂයේ සිට පැවත රු.4,811,225 ක් වටිනා චෙක්පත් පැවති අතර එම චෙක්පත් ගෙවිය යුතු නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස හඳුනාගෙන මු.රෙ. 396 පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම චෙක්පත් සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරමු. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.** මූල්‍ය සමාලෝචනය

---------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,114,086,727 ක ශුද්ධ ලාභයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.3,183,238,866 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.69,152,140 ක පිරිහීමක් විය. නොඉපයූ වාරික ආදායම සඳහා වූ සංචිතවල ශුද්ධ වැඩිවීම රු.622,874,854 කින් වැඩිවී තිබුණද, කොන්ත්‍රාත් වගකීම්හි දළ වෙනස්වීම රු.4,077,454,722 කින් අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2015 වර්ෂයේ රු. 4,303,324,331 ක් වූ අතිරික්තය, 2016 වර්ෂය අවසානයට රු.2,839,751,855 ක් දක්වා පහත වැටී තිබූ අතර 2017 වර්ෂයේදී එය තවදුරටත් රු.976,233,935 කින් පහත වැටී තිබුණද, 2018 වර්ෂයේදී රු.3,183,238,866 කින් යලි ඉහළ ගොස් තිබුණි. 2019 වර්ෂයේදී එය රු.3,114,086,727 ක් දක්වා එනම් රු. 69,152,139 කින් නැවතත් පහත වැටී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2015 වර්ෂයේදී රු.225,896,426 ක් වූ අරමුදලේ දායකත්වය ඉන් පසු වර්ෂවලදී වාර්ෂිකව උච්චාවචනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂවලදී එය රු. 148,943,768 ක් දක්වා අඩු වී තිබුණි. ඊට හේතුව ලෙස රු.105,600,661 ක් වූ ආදායම් බදු ආපසු ගැලපීමක් සිදු කර තිබීම නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| SRCC & TR අංශයේ ගිණුම් අංක 38 දරන නැවත ලැබිය යුතු තැන්පතු - ගබඩා (Refundable Deposit - Storage) ගිණුම යටතේ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් ගබඩා සඳහා රු.1,286,505 ක තැන්පතුවක් තබා තිබුණද, විගණිත දින වන විටත් ඊට අදාළ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | මෙයට අදාළ ගිවිසුමට එළඹීමට දැනටමත් කටයුතු කරගෙන යනු ලැබේ. | විධිමත් ගිවිසුම් වලට එළඹිය යුතු වීම . |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | 2019 අප්‍රේල් 2 දින පැවති SCAPC රැස්වීම අනුව මීට අදාල පුවත්පත් දැන්වීම විදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පල කිරීමට අනුමැතිය ලබාදී තිබුණත් එසේ සිදුකල බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. කෙසේ වුවද, පුවත්පත් දැන්වීම, විදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පල කිරීමට අදාළව එම අමාත්‍යාංශයේ විද්‍යුත් තැපෑලට යොමු කළ විද්‍යුත් ලිපියේ පිටපතක් පමණක් ඉදිරිපත් කරන ලදී. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් විසින්, තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම සම්බන්ධව 219 පෙබරවාරි 01 දිනැති ලිපිය, අප ආයතනය වෙත 2020 පෙබරවාරි 05 වන දින ෆැක්ස් මගින් ලැබී ඇති අතර එය ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2019 පෙබරවාරි 08 වන දින ලැබී ඇත. | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතු වීම. |
| (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 අනුව ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇඟයීම් කමිටුවේ සාමාජිකයින් විසින් ප්‍රකාශයක් (Declaration) ලබා දියයුතු වුවත් නිලධාරීන් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ අත්සනින් එම ප්‍රකාශලබා දී නොතිබුණි . | පිළිතුරු ලබා දීම සඳහා අවශ්‍ය ලිපිගොනු නැවත ලබා දී නොමැති බැවින් පිළිතරු ලබා දිය නොහැක. | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතු වීම. |
| (iii) | TEC රැස්වීම සඳහා එක් සාමාජිකයෙකු සහභාගී වී නොතිබුණු අතර නොපැමිණීමට අදාළ සටහනක් හෝ යොදා නොතිබුණි . එසේම, Bid Document සඳහා අනුමැතිය දීම සඳහා SCAPC රැස්වීමක් පවත්වා තිබුණද එහි එක් සාමාජිකයෙකුගේ පැමිණීම පමණක් සටහන් කළද තීරණ හා එකඟ වන/නොවන බවට අත්සන් යොදා නොතිබුණි. | පිළිතුරු ලබා දීම සඳහා අවශ්‍ය ලිපිගොනු නැවත ලබා දී නොමැති බැවින් පිළිතරු ලබා දිය නොහැක. | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (iv) Bid evaluation සඳහා පැවැත්වූ TEC රැස්වීම් වාර්තා අනුව, මේ සඳහා තිදෙනෙක් ඉදිරිපත් වී තිබූ අතර වැඩිම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය තෝරා ගැනීමට තීරණය කර තිබුණි .නමුත් අවම මිල බිලියන එකක් දක්වා අඩු විය යුතු බව සාමාජිකයින් දෙදෙනෙකු විසින් සටහනක් මඟින් දක්වා තිබුණි. | එකඟ වේ. | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතු වීම. |
| (v) අරමුදල විසින් 2018 වර්ෂයේ සැපයුම්කාර ආයතනය වෙත 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කරන බව දන්වා තිබුණි. කෙසේ වුවද, 2019 ජූලි 22 දින පැවති SCAPC රැස්වීම අනුව එම සමාගම 2016 ගංවතුර ආපදා සඳහා රු. 17,220,680 ක් අරමුදල වෙත ප්‍රතිපූර්ණය කලයුතුව තිබූ අතර විගණිත දින වන විටත් එම මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණි. නමුත් 2019 අගෝස්තු 20 දිනැති ලිපිය මඟින් 2019 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රතිරක්ෂණය දීර්ඝ කරන ලෙස අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි විසින් අදාල සමාගමට දන්වා තිබුණි. | එකඟ වේ. | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතු වීම. |
| (vi) අරමුදල යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින 1987 නොවැම්බර් 18 වන දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවන ලද වැඩවර්ජන, කැරළි ගැසීම් සහ ජන කැළඹීම් හා ත්‍රස්තවාදී අවස්ථා සඳහා පිහිටුවන ලද අරමුදලේ ප්‍රතිරක්ෂණ කටයුතු 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර ඊට අදාළ ප්‍රසම්පාදන ලිපිගොනු පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.<br>SRCC & TR අංශයේ 2019වර්ෂයේ ප්‍රතිරක්ෂණාවරණයට අදාළ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් පත් කර තිබුණු අතර එම කමිටුව මඟින් පහත තීරණ ගෙන තිබුණි. | | |
| i. ලංසුකරුවන් මුල් පිටපත් යොමු කර නොමැති බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව ඉදිරිපත් කර ඇති ලංසු වලංගු නොවන බව නිර්දේශ කර තිබුණ අතර ඒ අනුව ලංසු නැවත කැඳවීමට | එකඟ වේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කල යුතු වීම . |
| ii. අනිවාර්ය ලංසු කැඳවන කාලය වන දින 42ප්‍රමාණවත් නොවන බැවින් අමතර සති 02ක් ලබාදීමට | එකඟ වේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කල යුතු වීම . |

| | | |
|---|---|---|
| iii. පවතින ප්‍රතිරක්ෂණාවරනය 2019ජූලි 01දින සිට 2019දෙසැම්බර් 31දින දක්වා දීර්ඝ කිරීමට හා | එකග වේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කල යුතු වීම . |
| iv. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත 2019 ජනවාරි 01දින සිට දින දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට | එකග වේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කල යුතු වීම . |
| ඒ අනුව, 2019ඔක්තෝබර් 29දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 2324/108/2952/19වූ ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණාවරන කාල සීමාව දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කල 2019ඔක්තෝබර් 11 දිනැති සංදේශයේ සඳහන් පරිදි 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31දින දක්වා 2018 වර්ෂයේ සැපයුම්කාර සමාගමෙන් ප්‍රතිරක්ෂණාවරණය ලබා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි . | 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා 2018 වර්ෂයේ සැපයුම්කාර සමාගමෙන් ප්‍රතිරක්ෂණාවරණයලබා ගැනීමට, 2019 ඔක්තෝම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයන් අනුමැතිය ලබා දී ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කල යුතු වීම . |
| කෘෂිකාර්මික රක්ෂණාවරණයේ ප්‍රතිරක්ෂණාවරණයට අදාළව පත් කර තිබූ 2019 අගෝස්තු 06 අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු වාර්තා අනුව, ටෙන්ඩරය අවලංගු කර තිබුණි. | කෘෂිකාර්මික රක්ෂණාවරණයේ ප්‍රතිරක්ෂණාවරණයට අදාළව පත් කර තිබූ 2019 අගෝස්තු 06, අමාත්‍ය මණ්ඩල ප්‍රතිසම්පාදන කමිටු වාර්තා අනුව, ටෙන්ඩරය අවලංගු කර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කල යුතු වීම . |
| (vii) 2019/2020 වසර සඳහා ප්‍රතිරක්ෂණාවරණය පවරා දීම වෙනුවෙන් වූ ප්‍රසම්පාදනය සඳහා සුදුසු ප්‍රතිරක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා අරමුදල විසින් 2019 පෙබරවාරි 12 වන දින Daily News පුවත්පතෙහි හා අරමුදලේ වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කර තිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය මාර්තු 25 වන දින අවසන් කිරීමට තීරණය කර තිබුණි. | එකග වේ. | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතු වීම. |
| (viii) ප්‍රතිරක්ෂකයන් විසින් ඉදිරිපත් කරන ලද ලංසු මිල ගණන් හා අදාල අවශ්‍යතා අනුව, එක් රක්ෂණ ආයතනයක් මඟින් පලපුරුද්ද පිළිබඳ ලියවිලි ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන්, අවම මූල්‍ය ශක්තීන් (Financial Strength) අනාවරණය නොවීම මත හා ප්‍රතිරක්ෂණ වන්දි අයකර ගැනීම සම්බන්ධව අසතුටුදායක අත්දැකීම් වාර්තා වීම නිසා නැවත මිල ගණන් කැඳවීමට හා නව ප්‍රසම්පාදන ක්‍රමයක් උදෙසා යෑම සුදුසු බවත් එය මුදල් අමාත්‍යාංශය යටතේ පවතින අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් මත පදනම්ව සිදුවිය යුතු බවත් නිර්දේශ කර තිබුණි. | එකග නොවේ. අවම මිල තෝරා ගැනීමට, සාධාරණය කිරීම සඳහා හේතු දක්වා තිබුණි | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| **(ix)** කෙසේ වුවද, ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය සඳහා කාලරාමුව දින 91 ක කාලයක් ගන්නා බැවින්, පවතින ප්‍රතිරක්ෂණාවරණය 2019 ජුනි 25 වන දින දක්වා දීර්ඝ කිරීමට 2019 මැයි 15 වන දින පැවති අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මඟින් තීරණය කර තිබුණි. | එකඟ වේ. | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතු වීම |
| **(x)** නව ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුව, ලංසු ඉදිරිපත් කිරීමේ කාලය 2019 ඔක්තෝබර් 21 දක්වා ලබාදී තිබුණි. එම නිසා අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් පවතින ප්‍රතිරක්ෂණාවරණ ආවරණය 2019 මාර්තු 15 සිට 2020 මාර්තු 15 දක්වා ගිවිසුම දීර්ඝ කර ගැනීමට අදාළ කමිටු රැස්වීම් මඟින් නිර්දේශ කර තිබුණි. ඒ අනුව HF/113/CM/2019/296 යෝජනා ක්‍රමය යටතේ 2019 ඔක්තෝබර් 11 දින මුදල් අමාත්‍යවරයා විවිධ අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණාවරණ කාල සීමාව දීර්ඝ කිරීම යන සංදේශය සඳහා 19/2952/108/232 – 1 යන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අනුව අනුමැතිය ලබා දීමට කටයුතු කර තිබුණි | එකඟ වේ. | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතු වීම. |

**3.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **I.** ක්‍රියාකාරී සැලැස්ම මඟින් අග්‍රහාර අංශය යටතේ පිහිටුවන ලද රන් හා රිදී රක්ෂණය සඳහා අර්ධ රාජ්‍ය ආයතන ඉලක්කකරණය වැඩි කිරීම සඳහා අලෙවිකරණ අංශය ශක්තිමත් කිරීම, අග්‍රහාර රක්ෂණය සම්බන්ධ අඛණ්ඩ නිෂ්පාදන සංවර්ධනයේ නිරත වීම හා ඉහළ වාරිකයන් සඳහා විදේශීය ආවරණයන් ඇතුළුව වැඩි ප්‍රතිලාභ සහිත ප්ලැටිනම් කාණ්ඩයක් හඳුන්වා දීම යන අරමුණු ලඟා කර ගැනීමට කාල රාමුවක් හා ඒ සම්බන්ධ අදාළ කාර්යසාධන දර්ශක, ක්‍රියාකාරී සැලැස්ම තුළ නොවීය. එමෙන්ම ඒහා සම්බන්ධ කිසිදු ප්‍රගතියක් ප්‍රගති වාර්තාව මඟින්ද නිරීක්ෂණය නොවීය. | 2019 වර්ෂයේ හි පළමු කර්තු 3 ඇතුලත අග්‍රහාර රන් රිදී යෝජනා ක්‍රම යටතේ ඉලක්ක ගත සමාජික සංඛ්‍යාව බඳවා ගැනීමට හැකිවූ අතර 4 වන කාර්තුවට අදාල ඉලක්ක ගත ප්‍රමාණයන්ට බඳවා ගැනීමට නොහැකි විය. අර්ධ රාජ්‍ය ආයතන වලට අදාල ඉලක්ක ගත සාමාජික සංඛ්‍යාව බඳවා ගැනීමට නොහැකි වූ හේතු විමසුම් 04 යටතේ පැහැදිලි කර ඇත. අග්‍රහාර ප්ලැටිනම් රක්ෂණාවරණය හඳුන්වා දීමට පෙර අග්‍රහාර රන් රක්ෂණාවරණයට සමස්ථ අග්‍රහාර සාමාජිකයන් අවම වශයෙන් 80% ක ප්‍රතිශතයක් බඳවා ගැනීමෙන් පසුව ප්ලැටිනම් රක්ෂණාවරණය හඳුන්වාදීමට සැලසුම් කර තිබූ අතර | ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| | | අග්‍රහාර රන් රක්ෂණයට අපේක්ෂිත සාමාජික ප්‍රතිශතය **80%** සම්පූර්ණ වී නොමැති වීම හේතුවෙන් නව රක්ෂණාවරණය හඳුන්වාදීමට ප්‍රමාද වී ඇත. | |
| **II.** | **2019** ක්‍රියාකාරි සැලැස්මේ, අරමුණු **01** යටතේ ස්ථාපිත කරන ලද ආයතනික ප්‍රතිව්‍යුහකරණය තුළින්, **SRCC** හා **T** අරමුදල පවත්වා ගැනීම සඳහා **NITF** යටතේ අනුබද්ධිත සමාගම් **02** ක් පිහිටුවීමත් සමඟ නව ඒකාබද්ධ ආයතනික ව්‍යුහයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යසාධන දර්ශක **02** ක් හඳුන්වා දී තිබුණි.<br><br>මෙහිදී සහකාර සාමාන්‍යාධිකාරි (රක්ෂණ) , වැඩ බලන සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය), කළමනාකරු (මානව සම්පත් පරිපාලන) යන නිලධාරීන් විසින් දන්වා ඇති පරිදි ඒකාබද්ධ ප්‍රතිව්‍යුහකරණයේ ප්‍රගතිය සම්බන්ධයෙන් ඔවුන් නොදැනුවත් බව දන්වා සිටීම හේතුවෙන් මෙහි ප්‍රගතියක් විගණනයේදී නිරීක්ෂණය නොවීය. | **2019** ක්‍රියකාරී සැලැස්ම සැකසීමේදී පදනම් කොට ගෙන ඇත්තේ මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ **(FSMP)** යෝජිත පරිදි **NITF** ආයතනය සම්බන්ධයෙන් වූ යෝජනාවකි. **2018** එම යෝජනාවෙන් ආයතනය ප්‍රතිරක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය යන කොටස් දෙක වෙන් වෙන් වශයෙන් ආයතන **2** ක් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත. එම යෝජනාවට පෙර පැවති අධ්‍යක්ෂක මණ්ඩලය එකගව තිබු නමුත් මේ වන විටත් එය ක්‍රියාත්මක වී නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම |
| **III.** | අලුතින් පිහිටුවන ලද වඩා හොඳින් ප්‍රාග්ධනීකරණය කරන ලද ප්‍රතිරක්ෂණය සමාගමක් හරහා ප්‍රතිරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් කලාපීය ප්‍රමුඛයෙකු බවට පත්වීම යන අරමුණ පෙරදැරිව **2019** වර්ෂයේදී කාර්යසාධන දර්ශක **02** ක් ලඟාකරගැනීමට අරමුදල සැලසුම් කර තිබුණි. මෙහි ප්‍රගතිය සම්බන්ධයෙන් **2020** ජූලි **31** දින වනවිටත් තොරතුරු කිසිවක් අදාළ අංශ ප්‍රධානීන් ලබා දී නොමැති බව ප්‍රගති වාර්තාව අනුව නිරීක්ෂණය විය. | **2019** ක්‍රියකාරී සැලැස්ම සැකසීමේදී පදනම් කොට ගෙන ඇත්තේ මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ **(FSMP)** යෝජිත පරිදි **NITF** ආයතනය සම්බන්ධයෙන් වූ යෝජනාවකි. **2018** එම යෝජනාවෙන් ආයතනය ප්‍රතිරක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය යන කොටස් දෙක වෙන් වෙන් වශයෙන් ආයතන **2** ක් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත. එම යෝජනාවට පෙර පැවති අධ්‍යක්ෂක මණ්ඩලය එකගව තිබු නමුත් මේ වන විටත් එය ක්‍රියාත්මක වී නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම |
| **IV.** | නව ගොඩනැඟිල්ලේ බිම් මහලේ පාරිභෝගික හිතකාමී භෞතික පරිසරයක් නිර්මාණය කිරීම හා එම මධ්‍යස්ථානය තුළ පාරිභෝගික කේන්ද්‍රීප සේවා සැපයුම් පද්ධතියක් සැලසුම් කිරීම මඟින් රාජ්‍ය අංශයේ හොඳම පාරිභෝගික සේවා | නව ගොඩනැගිල්ලේ බිම් මහළේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සකස් කිරීමේ කටයුතු වල යම් ප්‍රමාදයක්ව නමුත් මේ වන විට එම කටයුතු අවසාන අදියරේ පවතින බව දන්වා සිටිමි. | ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම |

<table>
<tr><td></td><td>සපයන්නා බවට පත්වීම සඳහා අදාල කටයුතු 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරී සැලැස්ම මඟින් සැලසුම් කර තිබුණ ද, ඊට අදාල තොරතුරු කිසිවක් ප්‍රගති වාර්තාව තුලින් අනාවරණය නොවීය.</td><td></td><td></td></tr>
<tr><td>V.</td><td>අග්‍රහාර රක්ෂණය සඳහා අර්ධ රාජ්‍ය ආයතනවල දායකත්ව අනුපාතය වැඩි කිරීම මඟින් ඉහල සහභාගීත්වයක් ලබාගැනීම සඳහා 2019 වර්ෂයේ කාර්තුමය වශයෙන් 30% බැගින් සහභාගීත්ව අනුපාතය වැඩිකරගැනීමට ඉලක්ක කර තිබූ අතර එහි ඉලක්කගත හා සත්‍ය දත්තයන් අතර පහත පරිදි විචලනයන් නිරීක්ෂණය විය.
<table>
<tr><th></th><th colspan="4">2019</th></tr>
<tr><th></th><th>Q1</th><th>Q2</th><th>Q3</th><th>Q4</th></tr>
<tr><td>ඉලක්ක ගත</td><td>30%</td><td>30%</td><td>30%</td><td>30%</td></tr>
<tr><td>සත්‍ය</td><td>11%</td><td>12%</td><td>14%</td><td>14%</td></tr>
</table></td><td>අර්ධ රාජ්‍ය ආයතන සඳහා අග්‍රහාර රක්ෂණ දායකත්වය 30% දක්වා ඉහළ නැංවීමට 2019 වර්ෂය තුලදී ඉලක්ක ගත කර තිබුණි. කෙසේ වුවද අර්ධ රාජ්‍ය ආයතන වැඩි සේවක සංඛ්‍යාවක් සේවය කරන බොහොමයක් ඒ වන විටත් වෙනත් පෞද්ගලික රක්ෂණ ආයතන සමඟ 2019 වර්ෂය සඳහා රක්ෂණ ආවරණ ලබා ගෙන තිබුණු අතර ඒවා කල්පිරීම 2019 දෙසැම්බර් අවසානයේදී සිදුවන බව දන්වන ලදි. ඉන් පසුව එළැඹෙන වර්ෂයට ඔවුන් අග්‍රහාර රක්ෂණය ඉල්ලුම් කරන බව ආයතනය සමඟ සාකච්චා කර තිබුණු බව දැනුම් දෙමු.<br>එහිදී වෙනත් ආයතන සමඟ එතෙක් රක්ෂණ ආවරණ නොගෙන සිටි ආයතන පමණක් මෙම වර්ෂය තුල රක්ෂණයට දායකකර ගැනීම හේතුවෙන් සැලසුම් කල ඉලක්ක වෙත ලඟා වීමට නොහැකි වූ බව දන්වමු.</td><td>ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම</td></tr>
<tr><td>VI.</td><td>අග්‍රහාර රක්ෂණ පාරිභෝගික දත්ත පදනම සමඟ සම්බන්ධිත ඒකාබද්ධ හිමිකම් කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීමේ කටයුතු, 2019 වර්ෂයේදී පලමු කාර්තුව තුලදි නිම කිරීමට අරමුණු කොට තිබුණ ද 2020 වර්ෂයේ වන විටත් එය අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ අනුව එම ළඟා කර ගැනීම ද සතුටුදායක මට්ටමක නොවීය.</td><td>වර්තමාන කළමනාකාරිත්වය ICTA ආයතනයේ උපදේශක සේවා ලබාගෙන එම උපදෙස් මත අදාල හිමිකම් ගෙවීම් හා අග්‍රහාර අදායම් පද්ධතියක් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් ලබා දී ඇත.</td><td>ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම</td></tr>
<tr><td>VII.</td><td>කුඩා තේ වතු හිමියන් හා පශු සම්පත් ගොවීන් ආවරණය වන අයුරින් සහ ගොවිජන හා කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලය (AAIB) සමඟ වැඩි කාර්යභාර්යක් සහිත සම්බන්ධීකරණ ව්‍යුහයක් ගොඩනැගීම යන කාර්යසාධන</td><td>ස්වභාවික ආපදාවකදී හානියට ලක්වන නිවාස හා සුළු පරිමාණ ව්‍යාපාර සඳහා අත්‍යවශ්‍යාම අවස්ථාවක සේවාව ලබාදීමේ අරමුණින් 2016/04/01 සිට වාර්ෂිකව මුදල් අමාත්‍යාංශය වෙත</td><td>ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | දර්ශක ඇතුළත්ව ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණය (NNDIS) සඳහා මුදල් අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණය අමාත්‍යාංශය සමඟ එකඟතාවයකින් යුතුව ප්‍රතිලාභ ප්‍රතිව්‍යුහගත කිරීම සහ සීමාවන් ආවරණය කිරීම යන අරමුණු අරමුදල විසින් පිහිටුවා තිබුණි. නමුත් 31/03/2020දිනෙන් පසු 2021/2020 වසර සඳහා රක්ෂණ ඔප්පුව ජාතික රක්ෂණ භාර අරමුදල විසින් නිකුත් කර නොමැති බව අරමුදල විසින් විගණනට දන්වා තිබුණි. | ස්වාභාවික ආපදා රක්ෂණ ඔප්පුව නිකුත් කරන ලදි. නමුත් 2020/03/31 දිනෙන් පසු 2020/2021 වසර සඳහා රක්ෂණ ඔප්පුව ජාතික රක්ෂණ භාර අරමුදල විසින් නිකුත් කර නොමැත. | |
| VIII. | අරමුදල හා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය අතර වඩා හොඳ කාර්යභාරයන් සහ සම්බන්ධීකරණයක් සහිත වඩාත් හොඳින් ව්‍යුහගත කරන ලද කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම යන අරමුණ පෙරදැරිව ධීවරයන්ගේ යම් මූල්‍ය දායකත්වයක් ඇතිව ධීවරයින් සඳහා පුළුල් ආවරණයක් සහිත රක්ෂණ ක්‍රමයක් නිර්මාණය කිරීම සඳහා 2019වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම තුල සැලසුම් ඇතුලත් කර තිබුණද ,එහි ප්‍රගතිය පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය . | වගා බදු අරමුදලෙන් ගොවීන් වෙත වන්දි මුදල් ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලයේ ඉල්ලීම පරිදි සපයනු ලැබේ. ධීවර රක්ෂණය තවදුරටත් සලකා බලමින් පවතී. | ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම |
| IX. | සාමාන්‍ය රක්ෂණයේ ලාභදායීතාවයට සැලකියයුතු දායකත්වයක් ලබා දීම සඳහා වානිජ ස්වරූපයෙන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සංවර්ධනය කිරීම යටතේ 2019 වර්ෂයේදී අරමුදලේ සමස්ථ දළ වාරික ආදායමෙන් සාමාන්‍ය රක්ෂණයෙන් සියයට 6 ක කාර්තුමය දායතක්වයක් එනම් සියයට 24 ක වාර්ෂික දායකත්වයක් ලබාදීම, හා සාමාන්‍ය රක්ෂණය මඟින් බදු පෙර ලාභය ලෙස රු. මිලියන 17.5 ක වටිනාකමක් කාර්තුමය වශයෙන් එනම් වාර්ෂිකව රු. මිලියන 70 ක ලාභයක් දායකත්වයක් අරමුදල වෙත ලබා දීමට සැලසුම් කර තිබුණි.<br><br>මෙහි ප්‍රගතියද, වාර්ෂික ප්‍රගති වාර්තාව තුළ ඇතුළත් නොවූ අතර 2019 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුළ සාමාන්‍ය රක්ෂණය | එකඟ වේ. | ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| | තුළින් වාර්ෂිකව උපයා ඇත්තේ රු.13,889,693 ක අලාභයක් බව නිරීක්ෂණය වීම හේතුවෙන් එම ඉලක්කය වෙත ළඟා වී නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | | |
| X. | සාමාන්‍ය රක්ෂණයේ ඉදිරි ප්‍රගතිය වෙනුවෙන් පිහිටුවන ලද පහත සඳහන් අරමුණ හා එහි ප්‍රගතිය ලඟා කර ගැනීමට අදාළ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉදිරි වර්ෂ සඳහා වූ කාර්ය සාධනය පිළියෙළ කිරීමේ දී ඔබ විසින් පෙන්වා දුන් අඩුපාඩු සැලකිල්ලට ගැනීමට කටයුතු කරමු. | ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වීම |
| - | ව්‍යුහාත්මක පුහුණුව හා සංවර්ධන තුළින් කාර්ය මණ්ඩල හැකියාවන් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. | | |
| - | ලාභදායී හා කාර්යක්ෂම සැලසුම් හා තීරණ ගැනීම සඳහා සම්පූර්ණ රක්ෂණ පද්ධති විසඳුමක් ක්‍රියාත්මක කිරීම. | | |
| | ඉහළ දක්ෂතා දක්වන අය සඳහා පිලිගැනීමේ සහ ප්‍රතිලාභ ක්‍රමයක් හඳුන්වා දීම. | | |